USJP

ව්‍යාපෘති ඇගයීම

සංදීප ජයසේකර

Co-ordinating office | JMC Jayasekera Management Centre (Pvt) Ltd No 65/2A, Sir Chittampalam A Gardiner Mw, Colombo 02
Tel : 011 2 430451 | Mob : 071 488 4622, 071 415 0400 | Web : www.jmc.lk

1

ව්‍යාපෘති ඇගයීමක් කියන්නේ?

අයෝජන

දිගු කාලීන

වර්ධනය

අවදානම

Sandeepa Jayasekera - JMC 2

විවිධ ව්‍යාපෘති ඇගයීම් ක්‍රම



ප්‍රශ්ණ 01

මනෝජ් සමාගම සිය නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි කිරීමට නව යන්ත්‍රයක් මිලදි ගැනීමට අපේක්ෂා කරයි

පිරිවැය රු 2,000,000. ඵලදායී ජීව කාලය වසර 5. සුන්බුන් අගය රු 200,000. වාර්ෂික නඩත්තු පිරිවැය රු 50,000. නව යන්ත්‍රය භාවිතයෙන් වාර්ෂික සෘජු ශ්‍රම පිරිවැයෙන් රු 100,000ක් ඉතිරි කළ හැක

නව යන්ත්‍රයේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය ඒකක 10,000කි. එක ඒකකයක් රු 100 බැගින් විකිණිය හැකි අතර ඒකක විචල්‍ය පිරිවැය රු 60කි. යන්ත්‍රය ඵලදායී ජීව කාලය පුරා උපරිම ධාරිතාවයෙන් භාවිතා වනු ඇත.

ප්‍රශ්ණ 01

නව යන්ත්‍රය මිල දි ගත හොත් පැරණි යන්ත්‍රය රු 150,000කට විකිණිය හැක

10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක පහත පරිදි වේ

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

ඉහත ව්‍යාපෘතියට අදාළව

1 එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ යාම්

2 පිළිගෙවුම් කාලය

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

4 ශුද්ධ වර්තමාන අගය

5 ඔබේ තීරණය සඳහන් කරන්න

ප්‍රශ්ණ 02

සිදත් සමාගම නව නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. ව්‍යාපෘතිය ඇරඹීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ අතර ඒ සඳහා රු 20,000ක් වැය කරන ලදි. ව්‍යාපෘතිය සඳහා රු 200,000ක ආයෝජනයක් සිදු කළ අතර, එදිනම තවත් රු 100,000ක් වැය කර යන්ත්‍ර සූත්‍ර මිලදී ගන්නා ලදි. ස්ථාපනය කිරීමේ ගාස්තුව රු 15,000කි යන්ත්‍ර ප්‍රවාහන පිරිවැය රු 10,000කි මෙම යන්ත්‍ර වල සුන්බුන් වටිනාකම රු 20,000ක් විය.

වෙනත් ව්‍යාපෘතියකට යොදවා තිබූ මෝටර් රථයක් මෙම ව්‍යාපෘතියට භාවිතා කරන ලද අතර, එම ව්‍යාපෘතියෙන් අහිමි වන දායකය වාර්ෂිකව රු 5,000ක් වේ. ව්‍යාපෘතිය සඳහා කාරක ප්‍රාග්ධන ආයෝජනය රු 70,000ක් වන අතර, එය ව්‍යාපෘති කාලය වන අවුරුදු 5 අවසානයේ ලබා ගත හැක.

මෙම ව්‍යාපෘතිය හේතුවෙන් වර්ධනය වන ස්ථාවර පිරිවැය රු 45,000ක් වේ. ව්‍යාපෘතියේ ඒකක විකුණුම් මිල රු 20ක් වන අතර ඒකක විචල්‍ය පිරිවැය රු 15ක් වේ. ඒ ඒ වර්ෂයේ විකිණේ යැයි අපේක්ෂිත ඒකක ප්‍රමාණය පහත පරිදි වේ.

වසර	1	2	3	4	5
විකුණුම් ඒකක	6,000	20,000	30,000	60,000	40,000

ප්‍රාග්ධන පිරිවැය 10%ක් වන අතර වට්ටම් සාධක පහත පරිදි වේ

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

1 මෙම ව්‍යාපෘතියේ මුදල් ගලා ඒම් සහ යාම් ඇතුලත් ලේඛණයක් සකස් කරන්න
2 ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න
3 ව්‍යාපෘතිය භාරගත යුතුද නැත්ද යන්න තීරණය කරන්න

ප්‍රශ්ණ 03

දමිත් සමාගම වර්ෂ 3ක කාලයක් ඇතුලත පරිගණක යන්ත්‍ර නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් සළකා බලමින් සිටී
එහි තොරතුරු පහත පරිදි වේ

- වෙළඳපොළ සමීක්ෂණයක් සඳහා වැය කළ මුදල රු 200,000/-
- පරිගණක නිෂ්පාදන යන්ත්‍ර වල අපේක්ෂිත ආයෝජනය රු 1,200,000ක් වන අතර, 3 වෙනි වර්ෂය අවසානයේදී මෙම අගයෙන් 1/4ක් උපලබ්ධි වේ
- තෙවන වර්ෂයේ මුල රු 100,000ක් වූ යන්ත්‍ර අමතර කොටස් ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂා කරයි
- ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරීගේ වාර්ෂික වැටුප රු 500,000කි

- මෙම ව්‍යාපෘතිය නිසා සමාගමේ කාරක ප්‍රාග්ධනය රු 120,000 සිට රු 170,000 දක්වා වැඩි වන අතර, මෙම අතිරේක කාරක ප්‍රාග්ධනය ව්‍යාපෘතිය අවසානයේදී උපලබ්ධි වේ
- අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය සහ විකුණුම් ප්‍රමාණය පරිගණක යන්ත්‍ර 50කි
- පරිගණකයක අපේක්ෂිත විකුණුම් මිල රු 100,000කි
- පරිගණකයක අපේක්ෂිත විචල්‍ය පිරිවැය රු 80,000කි
- ව්‍යාපෘතිය නිසා ඇතිවන වාර්ෂික ස්ථාවර පිරිවැය (යන්ත්‍ර ක්ෂයද ඇතුළුව) රු 800,000කි

ප්‍රාග්ධන පිරිවැය 20%ක් වන අතර වට්ටම් සාධක පහත පරිදි වේ

වසර	1	2	3
වට්ටම් සාධකය	0.91	0.83	0.75

1 මෙම ව්‍යාපෘතියේ මුදල් ගලා ඒම් සහ යාම් ඇතුලත් ලේඛණයක් සකස් කරන්න

2 ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න

3 ව්‍යාපෘතිය භාරගත යුතුද නැත්ද යන්න තීරණය කරන්න

ව්‍යාපෘති ඇගයීම් වැදගත් කරුණු

Sandeepa Jayasekera - JMC 13

13

ව්‍යාපෘති ඇගයීමේදී පදනම් වන උපකල්පන සහ සම්මතයන්

වර්ෂය තුල හට ගන්නා මුදල් ප්‍රවාහ වර්ෂයේ අවසාන දවසේ ඇති වන බව

0 යනු පළමු වර්ෂයේ පළමු දවස වේ

1 යනු පළමු වර්ෂයේ අන්තිම දවස හෝ දෙවන වර්ෂයේ පළමු දවස වේ

2 යනු දෙවන වර්ෂයේ අන්තිම දවස හෝ තෙවන වර්ෂයේ පළමු දවස වේ
(මේ යනාදී විදියට වර්ෂ තීරණය වේ)

මූලික ආයෝජනය වර්ෂ 0 දී හටගන්නා බව

Sandeepa Jayasekera - JMC 14

14

ව්‍යාපෘති ඇගයීමේදි පදනම් වන උපකල්පන සහ සම්මතයන්

බදු වලින් පසු මුදල් ප්‍රවාහ සැළකිල්ලට ගනී

කාරක ප්‍රාග්ධනය (විශේෂයෙන් සඳහන් කර නොමැති නම්) වර්ෂය මුල මුදල් ගලා යෑමක් වේ

කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම මුදල් ගලා යාමක් වන අතර අඩු වීම මුදල් ලැබීමක් වේ

ව්‍යාපෘතිය අවසානයේ ඉතිරි කාරක ප්‍රාග්ධනය මුදල් ගලා ඒමක් බව

ව්‍යාපෘති ඇගයීමේදී සළකා බැලෙන මුදල් ලැබීම් ප්‍රවාහ

විකුණුම් තුලින් ලැබෙන මුදල්	ජංගම නොවන වත්කම් විකිණීම	සුන්බුන් විකුණුම්
ආවස්ථික ආදායම්	ආදායම් බදු ඉතිරිය	ආපසු ලැබෙන කාරක ප්‍රාග්ධනය

ව්‍යාපෘති ඇගයීමේදී සළකා බැලෙන මුදල් ගෙවීම් ප්‍රවාහ

ආයෝජනය	කාරක ප්‍රාග්ධන යෙදවීම්	මෙහෙයුම් වියදම් ගෙවීම්
ආදායම් බදු ගෙවීම්	ආවස්ථික පිරිවැය	වෙනත් අදාළ වියදම්

Sandeepa Jayasekera - JMC 17

17

ව්‍යාපෘති ඇගයීමේදී සළකා නොබැලෙන මුදල් ප්‍රවාහ

අදාළ නොවන පිරිවැයන්	පර්යේෂණ වියදම

දැනටමත් පවතින නව ව්‍යාපෘතිය නිසා ඇති නොවූ වියදම්

Sandeepa Jayasekera - JMC 18

18

මුදලේ කාල අගය තේරුම් ගමු

රු.100/-ක් අද ලැබෙනවාටද අවුරුද්දකට පසුව ලැබෙනවාටද ඔබ කැමති?

19

අද ලැබෙනවාට ඔබ කැමති!

හේතු

1. අද එය ලැබුනොත් ඔබට එය ආයෝජනය කර ආදායමක් උපයා ගත හැකිය

2. අද රු.100/- කින් ගත හැකි භාණ්ඩ හා සේවා එම මිලටම අවුරුද්දකට පසුව මිලදී ගත නොහැකිය

3. අද මුදල ලැබුනොත් එය නිශ්චිතය. අවුරුද්දකට පසුව මුදල ලැබීම අවිනිශ්චිතය.

20

එසේ නම් යම් මුදලක් අනාගතයේ ලැබෙන්නේ නම්

- අහිමි වන ආයෝජන ආදායමට - ආවස්ථික පිරිවැය
- මූර්ත අගය පහල යෑමට - උද්ධමනය
- අවිනිශ්චිතතාවට

වන්දියක් ලෙස **පොලිය**ක් බලාපොරොත්තු වේ.

වර්තමාන මුදල් ප්‍රවාහ + පොලිය = අනාගත මුදල් ප්‍රවාහ

21

අනාගත මුදල් ප්‍රවාහ තුල ඇතුළත් පොලිය ඉවත් කිරීම **වට්ටම් කිරීම** ලෙස හඳුන්වයි.

අනාගත මුදල් ප්‍රවාහය × වට්ටම් සාධකය = වර්තමාන මුදල් ප්‍රවාහය

$$\text{වට්ටම් සාධකය} = \frac{1}{1 + r ^n}$$

r = පොලී අනුපාතය

n = කාලය

විභාගයේදී වට්ටම් සාධක ලබා දේ

22

උදාහරණ

පහත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන් ගණනය කරන්න. (පොළී අනුපාතය 10% යැයි උපකල්පනය කරන්න)

වර්ෂය	අනාගත මුදල් ප්‍රවාහය	වට්ටම් සාධකය	වර්තමාන අගය	පොළිය
	A	B	C = A*B	D = A - C
0	100	1	100	0
1	110	0.91	100	10
2	121	0.83	100	21
3	133	0.75	100	33

23

23

විවිධ ව්‍යාපෘති ඇගයීම් ක්‍රම වල ඇති වාසි/අවාසි

සාධකය	ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය	පිළිගෙවුම් කාලය	වට්ටම් කළ පිළිගෙවුම් කාලය	ශුද්ධ වර්තමාන අගය
පිළියෙළ කිරීමේ පහසුව	√	√	X	X
තේරුම් ගැනීමේ පහසුව	√	√	X	X
ලාභය නොව මුදල් ප්‍රවාහ සැළකිල්ලට ගනී	X	√	√	√
මුදලේ කාල වටිනාකම සැළකිල්ලට ගනී	X	X	√	√
ව්‍යාපෘතියේ සියළුම මුදල් ප්‍රවාහ(හෝ ලාභය) සැළකිල්ලට ගනී	√	X	X	√
අයිතිකරුවන්ගේ ධනය උපරිම වන සේ තීරණ ගනී	X	X	X	√

24

24

ප්‍රශ්ණ 04

රන්ජන් සමාගම දුරකථන සංවාද පටිගත කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි ඔවුන් විසින් නව යන්ත්‍රයක් මිලදී ගැනීමේ ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් සළකා බලමින් සිටී යන්ත්‍රයේ මිල රු 120,000ක් වේ යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 5ක් වන අතර සුන්බුන් අගයක් නැත

ඒ ඒ වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් ගලා ඒම පහත පරිදි වේ

මෙම ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය 10%ක් වේ

1	2	3	4	5
25,000	30,000	45,000	50,000	30,000

මෙම ව්‍යාපෘතියේ ප්‍රාග්ධන පිරිවැය 10%ක් වේ

මෙම ව්‍යාපෘතියේ

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

2 පිළිගෙවුම් කාලය

3 වට්ටම් කළ පිළිගෙවුම් කාලය

4 ශුද්ධ වර්තමාන අගය

ගණනය කරන්න

ව්‍යාපෘතිය භාරගත යුතුද නැත්ද යන්න නිර්දේශ කරන්න

ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය
(Accounting Rate of Return ARR)

ව්‍යාපෘති ලාභය ආයෝජනයට ප්‍රතිලාභයක් ලෙස කොපමණ වන්නේද යන්න මැන බලයි

$$ARR = \frac{\text{සාමාන්‍ය ලාභය}}{\text{සාමාන්‍ය ආයෝජනය}}$$

Sandeepa Jayasekera - JMC 27

27

ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය
(Accounting Rate of Return ARR)

$$\text{සාමාන්‍ය ලාභය} = \frac{\text{මුළු ලාභය}}{\text{ව්‍යාපෘති කාලය}}$$

$$\text{සාමාන්‍ය ආයෝජනය} = \frac{(\text{ආරම්භක ආයෝජනය + සුන්බුන් වටිනාකම})}{2}$$

28

ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (Accounting Rate of Return ARR)

ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය > අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය → පිළිගනී

ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය < අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය → ප්‍රතික්ෂේප කරයි

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

$$ARR = \frac{\text{සාමාන්‍ය ලාභය}}{\text{සාමාන්‍ය ආයෝජනය}} X\ 100$$

$$ARR = \frac{12,000}{60,000} X\ 100$$

$$ARR = 20\%$$

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

$$\text{සාමාන්‍ය ලාභය} = \frac{\text{මූලු ලාභය}}{\text{ව්‍යාපෘති කාලය}}$$

$$\text{සාමාන්‍ය ලාභය} = \frac{60,000}{5}$$

$$\text{සාමාන්‍ය ලාභය} = 12,000$$

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

ව්‍යාපෘති ඇගයීම් වලදී ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් ක්ෂය අඩු කළ පසු අගය ලාභය ලෙස සැළකේ

මුළු ලාභය

සමස්ත ශුද්ධ මුදල් ප්‍රවාහය	180,000
(-) සමස්ත ක්ෂය	(120,000)
මුළු ලාභය	60,000

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

සමස්ත ශුද්ධ මුදල් ප්‍රවාහය

1	2	3	4	5	එකතුව
25,000	30,000	45,000	50,000	30,000	180,000

සමස්ත ක්ෂය

යන්ත්‍රයේ පිරිවැය	120,000
(-) සුන්බුන් වටිනාකම	-
ක්ෂය කළ හැකි අගය	120,000

33

1 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

සාමාන්‍ය ආයෝජනය = (ආරම්භක ආයෝජනය + සුන්බුන් වටිනාකම) / 2

සාමාන්‍ය ආයෝජනය = (120,000+0) / 2

සාමාන්‍ය ආයෝජනය = 60,000

34

පිළිගෙවුම් කාලය
(Payback Period)

ව්‍යාපෘතියට ආයෝජනය කළ මුදල අනාගත අනාගත මුදල් ප්‍රවාහ වලින් ආවරණය වන්නට ගත වන කාලය



පිළිගෙවුම් කාලය
(Payback Period)



2 පිළිගෙවුම් කාලය

වර්ෂය	මුදල් ප්‍රවාහ	සමුච්චිත මුදල් ප්‍රවාහ	සටහන්
0	(120,000)	(120,000)	
1	25,000	(95,000)	
2	30,000	(65,000)	
3	45,000	(20,000)	20000/50000*12
4	50,000	20,000	
5	30,000		

පිළිගෙවුම් කාලය = අවුරුදු 3 මාස 5

වට්ටම් කළ පිළිගෙවුම් කාලය (Discounted Payback Period)

ව්‍යාපෘතියට ආයෝජනය කළ මුදල, වට්ටම් කළ මුදල් ප්‍රවාහ (පොළිය ඉවත් කළ) තුලින් ආවරණය වන්නට ගත වන කාලය

වට්ටම් කළ මුදල් ප්‍රවාහ — සමුච්චිත මුදල් ප්‍රවාහ

වට්ටම් කළ පිළිගෙවුම් කාලය
(Discounted Payback Period)



3 වට්ටම් කළ පිළිගෙවුම් කාලය

වර්ෂය	මුදල් ප්‍රවාහ	වට්ටම් සාධකය	වට්ටම් මුදල් ප්‍රවාහ	සමුච්චිත වට්ටම් ප්‍රවාහ	සටහන්
0	(120,000)	1	(120,000)	(120,000)	
1	25,000	0.91	22,750	(97,250)	
2	30,000	0.83	24,900	(72,350)	
3	45,000	0.75	33,750	(38,600)	
4	50,000	0.68	34,000	(4,600	
5	30,000	0.62	18,600	14000	4600/18600*12

වට්ටම් කළ පිළිගෙවුම් කාලය = අවුරුදු 4 මාස 3

ශුද්ධ වර්තමාන අගය
(Net Present Value)

ව්‍යාපෘතියේ සමස්ත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන් සළකා බැලීමේදී ශුද්ධ අගය. මෙහිදී ව්‍යාපෘතිය හේතුවෙන් ව්‍යාපාරයේ වටිනාකම වැඩි වෙනවාද අඩු වෙනවාද යන්න හඳුනාගත හැකිය.

ශුද්ධ වර්තමාන අගය
(Net Present Value)



4 ශුද්ධ වර්තමාන අගය

වර්ෂය	මුදල් ප්‍රවාහ	වට්ටම් සාධකය (10%)	වර්තමාන අගය
0	(120,000)	1	(120,000)
1	25,000	0.91	22,750
2	30,000	0.83	24,900
3	45,000	0.75	33,750
4	50,000	0.68	34,000
5	30,000	0.62	18,600
		ශුද්ධ වර්තමාන අගය	14,000

ප්‍රශ්ණ 05

පියල් සමාගම සිය නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි කිරීමට නව යන්ත්‍රයක් මිලදී ගැනීමට අපේක්ෂා කරයි.

පිරිවැය රු.1,000,000

ඵලදායී ජීව කාලය වසර 5

සුන්බුන් අගය රු.100,000

වාර්ෂික නඩත්තු පිරිවැය රු.50,000

නව යන්ත්‍රය භාවිතයෙන් වාර්ෂික සෘජු ශ්‍රම පිරිවැයෙන් රු.250,000ක් ඉතිරි කළ හැක.

නව යන්ත්‍රය මිලදී ගත හොත් පැරණි යන්ත්‍රය රු.150,000කට විකිණිය හැක
10% අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය මත වට්ටම් සාධක පහත පරිදි වේ.
ඉහත ව්‍යාපෘතියට අදාළව

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

1 එක් එක් වර්ෂය සඳහා මුදල් ගලා ඒම් සහ යාම්
2 පිළිගෙවුම් කාලය
3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය
4 ශුද්ධ වර්තමාන අගය
5 ඔබේ තීරණය සඳහන් කරන්න

1 මුදල් ගලා ඒම් සහ යාම් ඇතුලත් ලේඛණය

	0	1	2	3	4	5
ආයෝජනය	(1,000,000)					
පැරණි යන්ත්‍රය ඉවත්කිරීම	150,000					
සුන්බුන් වටිනාකම						100,000
වාර්ෂික නඩත්තු පිරිවැය		(50,000)	(50,000)	(50,000)	(50,000)	(50,000)
සෘජු ශ්‍රම ඉතිරිය		250,000	250,000	250,000	250,000	250,000
ශුද්ධ මුදල් ප්‍රවාහය	(850,000)	200,000	200,000	200,000	200,000	300,000

2 පිළිගෙවුම් කාලය

වර්ෂය	මුදල් ප්‍රවාහ	සමුච්චිත මුදල් ප්‍රවාහ	සටහන්
0	(850,000)	(850,000)	
1	200,000	(650,000)	
2	200,000	(450,000)	
3	200,000	(250,000)	
4	200,000	(50,000)	
5	300,000	250,000	50,000/300,000*12

පිළිගෙවුම් කාලය = අවුරුදු 4 මාස 2

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

$$\text{ARR} = \frac{\text{සාමාන්‍ය ලාභය}}{\text{සාමාන්‍ය ආයෝජනය}}$$

$$\text{ARR} = \frac{70{,}000}{550{,}000}$$

$$\text{ARR} = 13\%$$

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

සාමාන්‍ය ලාභය = මුලු ලාභය / ව්‍යාපෘති කාලය

සාමාන්‍ය ලාභය = 350,00 / 5

සාමාන්‍ය ලාභය = 70,000

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

ව්‍යාපෘති ඇගයීම් වලදී ශුද්ධ මුදල් ප්‍රවාහයෙන් ක්ෂය අඩු කළ පසු අගය ලාභය ලෙස සැළකේ

මුළු ලාභය

සමස්ත ශුද්ධ මුදල් ප්‍රවාහය	1,250,000
(-) සමස්ත ක්ෂය	(900,000)
මුළු ලාභය	350,000

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

සමස්ත ශුද්ධ මුදල් ප්‍රවාහය

0	1	2	3	4	5	එකතුව
150,000	200,000	200,000	200,000	200,000	300,000	1,250,000

සමස්ත ක්ෂය

යන්ත්‍රයේ පිරිවැය	1,000,000
(-) සුන්බුන් වටිනාකම	(100,000)
ක්ෂය කළ හැකි අගය	900,000

3 ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය

සාමාන්‍ය ආයෝජනය = (ආරම්භක ආයෝජනය + සුන්බුන් වටිනාකම) / 2

සාමාන්‍ය ආයෝජනය = (1,000,000+100,000) / 2

සාමාන්‍ය ආයෝජනය = 550,000

4 ශුද්ධ වර්තමාන අගය

	0	1	2	3	4	5
ශුද්ධ මුදල් ප්‍රවාහය	(850,000)	200,000	200,000	200,000	200,000	300,000
වට්ටම් සාධක	1	0.91	0.83	0.75	0.68	0.62
වර්තමාන අගය	(850,000)	182,000	166,000	150,000	136,000	186,000
ශුද්ධ වර්තමාන අගය	(30,000)					

5 ශුද්ධ වර්තමාන අගය අනුව තීරණය

53

53

ප්‍රශ්ණ 06

සමන් සමාගම දැනට තිබෙන යන්ත්‍රයක් ඉවත් කර නව යන්ත්‍රයක් මිලදී ගැනීම පිළිබඳ සළකා බලමින් සිටී. නව යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 5ක් වේ.
නව යන්ත්‍රය මිලදී ගන්නේ නම් ව්‍යාපෘතිය ආරම්භයේදී රු.280,000/- ක අතිරේක කාරක ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එය ව්‍යාපෘතිය අවසානයේ දී නැවත ලබාගත හැකිය. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10%කි. වට්ටම් සාධක පහත පරිදි වේ.

ප්‍රශ්ණ 06

පහත දැක්වෙන්නේ යන්ත්‍ර දෙකේ මුදල් ප්‍රවාහයන් වේ (රු.000).

විස්තරය	නව යන්ත්‍රය	පවත්නා යන්ත්‍රය
පිරිවැය	1,000	-
වර්තමාන වෙළඳපොළ වටිනාකම	-	300
සුන්බුන් වටිනාකම	200	-
වාර්ෂික මෙහෙයුම් පිරිවැය		
1	100	300
2	100	300
3	120	320
4	120	320
5	140	360

ප්‍රශ්ණ 06

ප්‍රතිලාභ අනුපාතය 10%කි. වට්ටම් සාධක පහත පරිදි වේ.

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය	0.91	0.83	0.75	0.68	0.62

1 මෙම ව්‍යාපෘතියේ මුදල් ගලා ඒම් සහ යාම් ඇතුලත් ලේඛණයක් සකස් කරන්න

2 ශුද්ධ වර්තමාන අගය ගණනය කරන්න

3 ව්‍යාපෘතිය භාරගත යුතුද නැත්ද යන්න තීරණය කරන්න

1 මුදල් ගලා ඒම් සහ යාම් ඇතුලත් ලේඛණය

	0	1	2	3	4	5
ආයෝජනය	(1,000)					
පැරණි යන්ත්‍රය ඉවත්කිරීම	300					
සුන්බුන් වටිනාකම						200
වාර්ෂික මෙහෙයුම් පිරිවැය ඉතිරිය		200	200	200	200	220
කාරක ප්‍රාග්ධනය	(280)					280
ශුද්ධ මුදල් ප්‍රවාහය	(980)	200	200	200	200	700

57

57

2 ශුද්ධ වර්තමාන අගය

	0	1	2	3	4	5
ශුද්ධ මුදල් ප්‍රවාහය	(980)	200	200	200	200	700
වට්ටම් සාධක	1.00	0.91	0.83	0.75	0.68	0.62
වර්තමාන අගය	(980)	182	166	150	136	434
ශුද්ධ වර්තමාන අගය	88					

3 ශුද්ධ වර්තමාන අගය අනුව තීරණය

58

58